සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය

## නර්තනය (දේශීය)

**නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02යි.**

<u>I කොටස</u>

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ''සඳවට තරුවැල් ඇවිදින්'' කවිය
(1) තාලම් කවියකි (2) ලී කෙලි කවියකි
(3) කළගෙඩි කවියකි (4) කුළු කවියකි

(02) නම්‍යතා අභ්‍යාස කිරීමෙන්
(1) දිවීමට හැකියාව ලැබේ (2) කායික සංවර්ධනයක් ඇතිවේ
(3) පාඩම් කිරීමට හැකියාව ලැබේ (4) නිදා ගැනීමට හැකියාව ලැබේ

(03) උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්වලදී පාද හුරු කර ගැනීම සඳහා උපයෝගී වන මූලික සරඹ වන්නේ පිළිවෙලින්,
(1) පා සරඹ හා මණ්ඩි පදය (2) පා සරඹ හා ඉලංගම් සරඹය
(3) ගොඩ සරඹ හා දණ්ඩි සරඹය (4) මණ්ඩි පද හා දොඹින පදය

(04) උඩරට කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පුද ලබන ප්‍රධාන දෙවියන් වන්නේ,
(1) දෙවොල් දෙවි (2) කොහොඹා දෙවි (3) සමන් දෙවි (4) නාථ දෙවි

(05) පුරාණයේ සන්නිවේදන කාර්යය සඳහා යොදාගෙන ඇති වාද්‍ය භාණ්ඩය වන්නේ,
(1) දවුල (2) ගැට බෙරය (3) පහතරට බෙරය (4) තම්මැට්ටම

අංක 6 - 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යා කරන්න.

| A | B |
|---|---|
| (06) දවුල | a) වත බැඳීමේ චාරිත්‍රය |
| (07) විකල්ප වාද්‍ය භාණ්ඩ | b) ඉස්ලාම් බැතිමතුන්ගේ උත්සවයකි |
| (08) රද්දල්ලේ පොඩි මහත්මයා මහතා | c) හේවිසි වාදනය |
| (09) කතරගම පෙරහැර | d) ටින් බෙරය |
| (10) රාමසාන් උත්සවය | e) සබරගමු නර්තන සම්ප්‍රදාය |

අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා හිස් තැනට සුදුසු වචනය යොදන්න.

(11) වෙසක් කැකුළු ගීතයේ පද රචනය ................................................... විසින් කරන ලදී.

(12) එම්.එච්.ගෝමස් මහතා වඩාත් ප්‍රසිද්ධව ඇත්තේ ................................................ නර්තන ශිල්පියෙකු ලෙස ය.

(13) කතරගම පෙරහැරේ මුල්ම චාරිත්‍රය වන්නේ ................................................ යි.

(14) ''ලෙළ දෙමිනේ මල අඩු ගුවනේ'' කවිය ................................................ කවි ගායනයකි.

(15) ..................................................... මාත්‍රා 2 + 3 ට අයත් වන්නමකි.

පහත සඳහන් රූප සටහන් ඇසුරින් අංක 16 - 18 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D

(16) ඉහත රූප අතුරින් උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ඇඳුම් කට්ටලය වන්නේ,
(1) A (2) B (3) C (4) D

(17) C රූපයේ දක්වෙන නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය වන්නේ,
(1) ගාල්ල (2) මාතර (3) නුවර (4) රත්නපුරය

(18) රන්තෙලඹු වර්ණනාවේ එන කවි ගායනා සහිත නර්තන අංගයක් ඇතුලත් වන්නේ,
(1) A (2) B (3) C (4) D

(19) ශාන්ති කර්මවලදී දෙවියන්ට ආරාධනා කරන කාව්‍ය විශේෂය වන්නේ,
(1) තාලම් කවි (2) තල මල වරුණ කවි (3) මල් යහන් කවි (4) සිරස පාද කවි

(20) ''උඩරට නැටුම් කලාව'' නැමැති ග්‍රන්ථය රචනා කරන ලද්දේ
(1) රද්දල්ලේ පොඩි මහත්මයා මහතා (2) ජේ.ඊ. සේදරමන් මහතා
(3) එම්.එච්.ගෝමස් මහතා (4) මුදියන්සේ දිසානායක මහතා

(ලකුණු 1 × 20 = 20

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් පස්වන පා සරඹය/මණ්ඩි පදය ලියා දක්වන්න.

(ii) මාත්‍රා 3 + 4 ට අයත් බෙර පදයක්/දවුල් පදයක් ප්‍රස්තාර කර දක්වන්න.

(iii) ලී කෙළි නර්තනය අලංකාර කර ගැනීමට යොදා ගත හැකි වාද්‍ය භාණ්ඩ 2ක් නම් කරන්න.

(iv) මාත්‍රා 3 තනි තිතට අදාල කුළු කවියක් ලියා දක්වන්න.

(v) '' අද වෙස්සන්තර '' නූර්ති ගීතය පද රචනය කළේ කවුරුන්ද?

(ලකුණු 2 × 5 = 10)

02) (i) සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කරන්න. (ලකුණු 02)

(ii) එම වාද්‍ය භාණ්ඩය වාදනය කරන අවස්ථා 2ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) එම වාද්‍ය භාණ්ඩය ඇඳ කොටස් 3 ක් නම් කරන්න. (ඇඳීමට ලකුණු 01)

(නම් කිරීමට ලකුණු 03)

03) (i) මාත්‍රා 3 + 3 ට තාල රූපයට ආදාල වන්නමක බෙර පදය/දවුල් පදය නම් කරන්න. (ලකුණු 02)

(ii) එම වන්නමට අදාල කවියක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

(iii) එම වන්නමට අදාල කස්තිරම/ඉරට්ටිය/කලාසම ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(04) (i) ඉන්දියාවේ පවතින ගැමි නැටුම් අතරින් සුවිශේෂ ගැමි නැටුමක් නම් කරන්න (ලකුණු 02)

(ii) එම නැටුමේ පුද ලබන දෙවිවරු හා උත්සව පවත්වන කාල සීමාව නම් කරන්න. (ලකුණු 04)

(iii) එම නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ 2ක් හා ඊට යොදා ගන්නා සංගීතය නම් කරන්න (ලකුණු 04)

(05) ''ගැමි නැටුම් ගැමියන් විසින් නිර්මාණය කරන ලද නැටුම් විශේෂයකි.''

(i) ඔබ දන්නා ගැමි නැටුම් 4ක් ලියන්න (ලකුණු 02)

(ii) ගැමි නැටුම්වලට ආවේනික පොදු ලක්ෂණ 4ක් ලියන්න (ලකුණු 04)

(iii) ඔබ උගත් ගැමි නැටුම් දෙකකට අදාල කවි දෙකක් ලියා දක්වන්න (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය

## නර්තනය (දේශීය)

## ප්‍රායෝගික පරීක්ෂණය

කාලය: පැය 02යි.

නම/විභාග අංකය :- ..........................................................

(ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් පිරිනැමේ)

(1) (i) කැමති ජන ගායනයක් (ලකුණු 05)

(ii) පහත දෙන ලද ගායනයක්
(තල මල වරුණ කවියක්/කුළු කවියක්/මල් යහන් කවියක්/තාලම් කවියක්) (ලකුණු 05)

(2) පහත දෙන ලද ගොඩ සරඹයක්/ඉලංගම් සරඹයක්/දොඹින පදයක්
(2/3/4 සරඹ වලින් එකක්) (ලකුණු 10)

(3) කුලු/තාලම් නැටුමක් (ලකුණු 10)

(4) මාත්‍රා 2 + 3 ට අදාල වන්නමක් (ලකුණු 20)